*සැ. යු.* - 2022.07.29 දින පළ වූ අංක 2,291 *ගැසට් පත්‍රයේ* II සහ IV(අ) කොටස් පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,292 - 2022 අගෝස්තු මස 05 වැනි සිකුරාදා - 2022.08.05**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... ... | 560 |
| මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 560 |


*සැ. යු.*- (i) ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා (සංශෝධන) පනත් කෙටුම්පත 2022 ජූලි මස 15 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) වංචා වැළැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පත 2022 ජූලි මස 15 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) ළමයින් සහ තරුණ තැනැත්තන් (සංශෝධන) පනත් කෙටුම්පත 2022 ජූලි මස 15 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2022 අගෝස්තු මස 26 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 අගෝස්තු මස 12 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

ගංගානි ලියනගේ,
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

## පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

මීගමුව දිසා අධිකරණයේ දීය

*පැමිණිලිකරු*

වර්ණකුලසූරිය සුරේෂ් ප්‍රිමාල් සෝවිස්,
අංක 52/1, කම්මල්තොට,
කොච්චිකඩේ.

ඇස්කිසි අංකය : 14/2022
නඩු අංකය : 3498/උකස්

එදිරිව

*විත්තිකරු*

අලහකෝන් මුදියන්සේලාගේ උපාලි ජූඩ් නවරත්න,
අංක 30/4, බණ්ඩාරවත්ත,
කොච්චිකඩේ.

ඉහත අංක දරන නඩුවේ තීන්දු ප්‍රකාශය මඟින් රුපියල් 2,509,000.00 ක මුදලක් සඳහාත්, එම මුදල ගෙවා නිමවන තෙක් පැමිණිල්ලේ දින සිට රුපියල් 1,650,000.00 ක මුදලක් වසරකට සියයට හැත්තෑ දෙක (72%) බැගින් පොළිය සහ ව්‍යවස්ථාපිත ගාස්තුව ද සමඟ පැමිණිලිකරුට අයකර ගැනීමට ආඥා කොට ඇති බැවින්ද,

විත්තිකරු විසින් තීන්දු ප්‍රකාශය කඩකරමින් පැමිණිලිකරු වෙත ගෙවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති බැවින් ද, විත්තිකරුට විරුද්ධව ඇස්කිසි නිකුත් කිරීමට ඉල්ලා ඇති බැවින් ද, 2022.02.09 දිනැති අධිකාරි පත්‍රය යටතේ පහත සඳහන් උපලේඛනයේ දේපළ විකිණීමට විධාන කර ඇති බැවින් ද,

මුදල විත්තිකරුගෙන් අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපල එකී ඉහත විස්තර කර ඇති දේපලට අයත් සියලුම අයිතිවාසිකම්, පරවශ්‍යතා සහ අනුබද්ධිකයන් ද විත්තිකරුගෙන් කවර ආකාරයෙන් හෝ සියලුම අයිතිවාසිකම්, හිමිකම්, බලපුලුවන්කාරකම්, හිමිකම්පෑම් සහ ඉල්ලීම් ද මෙහි උපලේඛනයේ හා පැමිණිල්ලේ උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපලෙන් උපදන සහ එකතු වන සියලු කුලී ලාභ සහ අනෙකුත් ආදයම් ද සියලු ගිවිසුම් සහ එකී රක්ෂණ ගිවිසුම් ද ඇතුලුව මෙහි උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇති එකී දේපල නිශ්චිතව ම බැඳී ඇති බව ඇස්කිසි කල හැකි බව ප්‍රකාශ කරන ලද හෙයින් ද,

එකී මුදල අයකර ගැනීම සඳහා අධිකරණය විසින් අනුමත කරන ලද විකිණීමේ කොන්දේසිවලට යටත්ව පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපල.

**වර්ෂ 2022ක් වූ අගෝස්තු මස 31 වැනි දින ප. ව. 2.30ට** එම දේපල පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී වෙන්දේසියේ ඉහලම ලංසු තබන්නා ගැණුම්කරු වන අතර, වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් මුලු ගැණුම් මිලෙන් 25% ක මුදලක් ද, පිස්කල් ගාස්තු ද, රජයට අයවිය යුතු ගාස්තු, තක්සේරු ගාස්තු, වෙන්දේසි ගාස්තු, පුවත්පත් වල ප්‍රසිද්ධ කිරීමේ වියදම් ද, අනෙකුත් ප්‍රචාරක කටයුතු සඳහා වියදම් එවලේ ම මුදලින් මා වෙත ගෙවිය යුතුය. චෙක්පත් භාරගනු නොලැබේ. ගැණුම් මිලෙන් 75%ක ඉතිරි මුදල දින 30ක් ඇතුළත මීගමුව දිසා අධිකරණයේ ඉහත කී අංක දරන නඩුවට තැන්පත් කල යුතුය.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයට අයත් අලුත්කුරු කෝරළයේ දසිය පත්තුවේ මීගමුව මහ නගර සභා සීමාව තුළ උතුරු පල්ලන්සේන පිහිටි පාසල් මාවතේ වරිපනම් අංක 40 දරන කොටසින් කොටසක් වන 'බණ්ඩාරවත්ත' නැමැති ඉඩමෙන් එස්. එම්. දිසානායක බලයලත් මානක තැන විසින් 1996.10.09 වැනි දින මැන සාදන ලද අංක 4051 ඒ දරන පිඹුර ප්‍රකාර බෙදූ ලොට් අංක 04 දරන කොටස වන උතුරට සහ නැගෙනහිරට : කතෝලික පල්ලියට අයිති කුඹුරද, දකුණට : අඩි 12ක් පළල පාරද, බස්නාහිරට : ලොට් අංක 03 දරන කොටසද, මායිම් වන පර්චස් එකොළහක් (ප. 11.0) විශාල ඉඩමේ බිම සහ ඊට අයත් ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සෑම සියලු දේත් වේ.

මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 1128/61 හි ලියාපදිංචි වී ඇත.

අධිකරණයේ අණ පරිදි,

රෙජිස්ට්‍රාර් තැන,
මීගමුව දිසා අධිකරණය.

වර්ෂ 2022ක්වූ ජූලි මස 28 වැනි දී ය.

08-55

# විවිධ දැන්වීම්

## අන්තර්ජාතික ථේරවාද ධර්මායතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

මෛත්‍රීපාල සිරිසේන වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ අංක 53(1) දරන ස්ථාවර නියෝගය යටතේ "අන්තර්ජාතික ථේරවාද ධර්මායතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි." යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී ධර්මායතනය සංස්ථාගත කිරීමයි :-

(අ) බෞද්ධ ඉගැන්වීම්වලට අනුව උත්තරීතර විමුක්තිය වන නිර්වාණය තනිව සාක්ෂාත් කිරීමට අවශ්‍ය ධර්ම විනය ඥානයෙන් සහ භාවනා පිළිබඳ ඥානයෙන් යුක්ත වූ ගිහි පැවිදි පිරිසක් බිහි කිරීම;

(ආ) බෞද්ධ ඉගැන්වීම්වලට අනුව උත්තරීර විමුක්තිය වන නිර්වාණය සාක්ෂාත් කර ගැනීම සඳහා ගිහි පැවිදි දෙපාර්ශවයට මඟ පෙන්වීමට සමර්ථ වූ ගිහි පැවිදි පිරිසක් බිහි කිරීම.

(ඇ) ථේරවාද බෞද්ධ ඉගැන්වීම්වලට අනුව නිවැරදිව විනය කර්ම සිදුකිරීම මඟින් ශාසනය අවිච්ඡින්නව පවත්වාගෙන යාමට සමර්ථ වූ බෞද්ධ භික්ෂූන් වහන්සේලා බිහි කිරීම.

යනාදිය වේ.

**මෛත්‍රීපාල සිරිසේන,**
පාර්ලිමේන්තු මන්ත්‍රී.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | *රු.* | *ශ.* |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 | 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට ... ... ... | 1,300 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට්* පිටුවකට ... ... ... | 2,600 | 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ...... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | **පිටපතක මිල** | **තැපැල් ගාස්තුව** |
|---|---|---|
| I වැනි කොටස : | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

**2022 වර්ෂය**

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| **අගෝස්තු** | 2022.08.05 | සිකුරාදා | 2022.07.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.08.12 | සිකුරාදා | 2022.07.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.08.19 | සිකුරාදා | 2022.08.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.08.26 | සිකුරාදා | 2022.08.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| **සැප්තැම්බර්** | 2022.09.02 | සිකුරාදා | 2022.08.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.09.09 | සිකුරාදා | 2022.08.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.09.16 | සිකුරාදා | 2022.09.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.09.23 | සිකුරාදා | 2022.09.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.09.30 | සිකුරාදා | 2022.09.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| **ඔක්තෝබර්** | 2022.10.07 | සිකුරාදා | 2022.09.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.10.14 | සිකුරාදා | 2022.09.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.10.21 | සිකුරාදා | 2022.10.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.10.28 | සිකුරාදා | 2022.10.14 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.